# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# පෙරදිග සංගීතය

## විෂය නිර්දේශය
## 12 සහ 13 ශ්‍රේණි

(2017 සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1.0 | හැඳින්වීම | i |
| 2.0 | ජාතික අරමුණු | ii |
| 3.0 | මූලික නිපුණතා | iii-v |
| 4.0 | පෙරදිග සංගීත විෂයයේ අරමුණු | vi |
| 5.0 | ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | vii |
| 6.0 | විෂය නිර්දේශය | 1-10 |
| 7.0 | පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 11 |
| 8.0 | තක්සේරුව හා ඇගයීම | 12 |
| 9.0 | විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | 13 |

# 1.0 හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ උසස් පෙළ විෂය නිර්දේශය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 11ක් මෙම විෂය නිර්දේශය මඟින් ආවරණය කෙරේ.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගෙන ගොඩ නඟා ඇති වුව ද කිසියම් ශිෂ්‍යයෙක් වාදනය මූලික කොටගෙන මෙම විෂයය  හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මඟින් සියලු ම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැකි ය.

6 සහ 11 ශ්‍රේණිවල දී අධ්‍යයනය කළ විෂය කරුණු තව දුරටත් ගැඹුරින් අධ්‍යයනය කිරීම උසස් පෙළ දී අපේක්ෂිත ය. එසේ ම සංගීතය තම නිර්මාණ කාර්යයන්ට යොදා ගැනීම මෙන් ම සංගීතයේ භෞතික විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක අධ්‍යයනයන්ය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ද මඟ පෙන්වීම හා පරිගණකයෙන් සංගීත නිර්මාණකරණයට පිවිසීමට අත්වැලක් සැපයීම ද මෙම විෂය නිර්දේශයෙන් සිදු කොට ඇති නව්‍ය ප්‍රවේශයන්ය.

පන්ති කාමරයෙන් ලබා ගන්නා අධ්‍යාපනයට අමතර ව අන්තර්ජාලය හා , පුස්තකාලය පරිශීලනයෙන් තම දැනුම් පරාසය පුළුල් කර ගැනීමට සිසුන් පෙළඹවීම මෙහි නිර්දේශිත විෂය කරුණු පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීමට සිසුන්ට කෙරෙන වටිනා මඟපෙන්වීමක් වනු ඇත.

# 2.0 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන් සහ කණ්ඩායම් ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය මඟින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

විසින් ප්‍රත්‍යක්ෂ කරගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණශීලී හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයා ගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකය තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කරගැනීමට දායක වනු ඇත

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව** : පරිගණක දැනුම සහ ඉගැනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම

## (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරාසිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවි ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජිවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුශලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, තීන්ද්‍ර, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජිවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගුවේ.

## (IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනාගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ
- වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

## (V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීකරණය

## (VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

## (VII) 'ඉගැනීමට ඉගැනුම' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙනගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# 4.0 පෙරදිග සංගීත විෂයයේ අරමුණු

1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.
2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙලඹෙයි.
3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයන්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි.
4. ශ්‍රී ලාංකේය ව්‍යාවහාරික සංගීත ක්ෂේත්‍රයේ ප්‍රබලතම අංගය ලෙසට අගය කරමින් සරල ගී සංකල්පයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි.
5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැලකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.
6. දේශීය රංග සම්ප්‍රදායයන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි.
7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි.
8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය මට්ටමට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ අභ්‍යාසයේ යෙදෙයි.
9. සංගීතයේ භෞතික විද්‍යාත්මක ජීවවිද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම අත්හදා බැලීම් කරයි.
10. සංගීත විෂයය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගික ව හඳුනා ගනියි.
11. නූතන වෙළෙඳපොළට ගැළපෙන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙලඹෙයි.

# 5.0 ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| පෙරදිග සංගීත විෂයයේ අරමුණු | ජාතික අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | | | | | ✓ | | | |
| 2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙලඹෙයි. | | ✓ | | | | | | |
| 3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයන්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි. | ✓ | | | | | | | |
| 4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ජනප්‍රියතම අංගය ලෙසට අගය කරමින් සරල ගීතයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි. | | | ✓ | ✓ | | | | |
| 5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැලකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. | ✓ | | | | | | | |
| 6. දේශීය රංග සම්ප්‍රදායයන් හා බැඳි රංග ශෛලින් සහ සංගීත ශෛලින් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි. | | | ✓ | | | | | |
| 7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි. | | | | | | | | ✓ |
| 8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය තත්ත්වයට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ ව අභ්‍යාසයේ යෙදෙයි. | | | | | | | | ✓ |
| 9. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම පිළිබඳ ව අත්හදා බැලීම් කරයි. | | | | | | | ✓ | |
| 10. සංගීත විෂය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගික ව හඳුනා ගනියි. | | | | | | | ✓ | |
| 11. නූතන වෙළෙඳපොළට ගැළපන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙලඹෙයි. | | | | ✓ | | ✓ | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි | 1.1 රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක්/වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | • මන්ද්‍ර, මධ්‍ය, උච්ච සප්තක කරා විහිදුණ ස්වර අභ්‍යාස<br>• කටහඬ පාලනය පිළිබඳ අභ්‍යාස<br>• ගායනයේ දී සිරුරේ ඉරියවු (ස්වරාලය, උගුර, පිටකොන්ද මුහුණ) හෝ වාදනයේ ඉරියවු සහ හස්ත සාධන අභ්‍යාස.. | රාගධාරී සංගීතය අධ්‍යයනයට පිවිසෙන ආධුනිකයකු ලෙස අවශ්‍ය මූලික කුසලතා වර්ධනය කරගනියි. | 02<br><br>02<br>02 |
| | 1.2 උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමකම් හඳුනා ගනිමින් ගායනයේ/වාදනයේ යෙදෙයි. | • බාගේශ්‍රී දේස් ආසාවරී යන රාගවල සර්ගම් සහ මධ්‍යලය ගීත හා රාග විස්තර<br>• දේස් - තිලක්කාමෝද් ආසාවරී-ජෞනපූරි යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මගින් ප්‍රායෝගික ව<br>• ගායනා සමය, මුඛ්‍යාංග | රාගධාරී ගීත ගායනයේ යෙදෙයි.<br><br>නිර්දේශිත රාගවල සෛද්ධාන්තික පසුබිම හා සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කරමින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගනියි. | 54<br><br>12<br><br>02<br><br>02 |
| | 1.3 සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගි වන සංකල්ප පිළිබඳ ව අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කරයි. | • ආලාප සහ ආලාප වර්ග<br>• තාන සහ විවිධ තාන වර්ග<br>• මීන්ඩ්, ගමක්, කණ්, මුර්කි, ආන්දෝලන් සහ උපජ්, ජලා, මුඛඩා, තිහායි, චක්‍රදාර් වැනි (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික කරුණු)<br>• නිර්දේශිත රාගයන්හි සුවිශේෂ ස්වර සංගති මගින් රාග අතර වෙනස්කම් දැක්වීම (ප්‍රායෝගික ව)<br>• රාගවිස්තාර හෝ කෙටි ආලාප ඛණ්ඩ (මධ්‍යලය ගීතයේ ප්‍රායෝගික අභ්‍යාස සමග)<br>• නිර්දේශිත රාග හතරේ විවිධ තානාලංකාර (මධ්‍යලය ගීතයේ ප්‍රායෝගික අභ්‍යාස සමග) | උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කෙරෙන සුවිශේෂ අංග හා ශිල්පාංග පිළිබඳ ප්‍රායෝගික හුරුව ලබයි. | 02<br>08<br>-<br>-<br>- |

| | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | | 1.4 තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි. | • ගති මිති ලය යන පාරිභාෂික පද<br>• ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ, දෙගුණ නිරූපණය<br>• ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු<br>• දේශීය තිත් ක්‍රමය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප සෛද්ධාන්තික ව හා ප්‍රායෝගික ව අධ්‍යයනය | උත්තර භාරතීය සංගීතයේ තාල පද්ධතිය හා බැඳි සංකල්ප වෙන් කොට දක්වමින් නිර්දේශිත තාල ප්‍රායෝගිකව භාවිත කිරීමේ කුසලතාව ලබයි.<br><br>දේශීය තිත් රූප ගොඩනැගීමේ පදනම විග්‍රහ කරමින් දෙතිතට අයත් තිත්රූප ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතා ලබයි. | 02<br>04<br>04<br>04 |
| 2.0 | විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. | 2.1සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස් කරයි. | • විවිධ නිර්වචන මඟින් සංගීතය යනු කුමක් දැයි පැහැදිලි කිරීම.<br>• සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු (භාෂාව, දේශගුණික, භූගෝලීය සාධක)<br>• ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති (පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය Melody & Harmony සිද්ධාන්තය, ස්වර සාධන විධි) | සංගීතය විශ්වයට පොදු කලාවක් ලෙසට හා විවිධ හේතුසාධක මත එකිනෙක වෙනස් වන බවට තර්ක කරයි. | 02<br>02<br>02 |
| | | 2.2 භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹෙයි. | • භාරතීය සංගීතයේ ස්වභාවය<br>• උත්තර සහ දක්ෂිණ සංගීත පද්ධතීන් හි සමවිෂමතා<br>• උතුරු ඉන්දීය ගායන ශෛලීන් (ධ්‍රැපද්, ධමාර්, චතුරංග) හා බැඳි සිද්ධාන්ත<br>• ඛ්‍යාල්, තරාණා, භජන්, ගසල් කව්වාලි ප්‍රායෝගික සහ සිද්ධාන්ත කොටස් ඇසුරින් තර්කානුකූල ව සහ සංසන්දනාත්මක අදහස්<br>• තරාණා ගීතයක් (මාලකෞන්ස් රාගයෙන්) | භාරතීය සංගීතයේ ස්වභාවය හා පැරණිතම ගායන ශෛලීන් පිළිබඳ සෛද්ධාන්තික කරුණු අධ්‍යයනය කරමින් අත්‍යවශ්‍ය ශෛලීන් කිහිපයක ප්‍රායෝගික දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 02<br>02<br>04<br>12<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 3.1 වාදන දක්ෂතා ප්‍රසංගාත්මක ව ප්‍රදර්ශනය කරයි. | සියලු සිසුන් සඳහා ස්වරපුවරු භාණ්ඩ වාදනය (උසස් පෙළට ගැළපෙන ලෙස)<br>• ගායනය ප්‍රධාන කරගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා, පල්ටා, තිහායි, මුඛඩා)<br>• වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යුහය, කොටස් පිළිබඳ දැනුම<br>• වාදනය කරනු ලබන භාණ්ඩය තනි ව සුසර කර ගැනීමේ අභ්‍යාස<br>• වාදනය ප්‍රධාන කරගත් සිසුන් නිර්දේශිත සියලු ප්‍රායෝගික කොටස් වාදනය කිරීම | ස්වර පුවරු භාණ්ඩයක් වාදනය කිරීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.<br><br>ස්වර වාද්‍ය භාණ්ඩයක ව්‍යුහය අවබෝධ කරගනිමින් සහ එය තනි ව සුසර කරගනිමින් වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි.<br><br>නැතහොත් තබ්ලාව සරල ශාස්ත්‍රීය කොටස් සමඟ සරල ව වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 12<br>12<br>02<br>02<br>-- |
| 4.0 සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 4.1රාගධාරී සංගීතය ආශ්‍රයන් නිර්මාණය වී ඇති ගායන විශ්ලේෂණාත්මක ව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි. | • ගුරුවරයාගේ අභිමතය පරිදි රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල/ හින්දි සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදනයේ යෙදීම සහ ගායනය/වාදනය | ශාස්ත්‍රීය පදනමක් සහිත හින්දි හෝ සිංහල හෝ ගීතයක් ගයා/වයා රසාස්වාදනයේ යෙදෙයි. | 06 |
| 5.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 5.1 ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන/වාදන දක්ෂතා වර්ධනය කර ගනියි. | • ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු<br>• ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී<br>• උඩරට, පහතරට, සබරගමු වශයෙන් ගැමි ගී ගායනාවල වෙනස්කම් (ශාන්ති කර්ම ගී ඇසුරින්)<br>• අනාසාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද)<br>• මෙහෙ ගී (නෙළුම් ගී, ඕසේ ගායනා) - වරම් ගී | ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ ව තොරතුරු රැස් කරමින් තෝරාගත් ගැමි ගී ගායනයේ යෙදෙයි. | 02<br>02<br>04<br>06<br>03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | 6.1ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | • මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය (රාජ්‍ය අනුග්‍රහය, රජවාසලේ සංගීතය හා සම්බන්ධ ආයතන, කවිකාර මඩුව, කර්ණාටක සංගීතයේ ආභාසය)<br>• සංගීත අධ්‍යාපනය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයන් හා ඔවුන් කිහිප දෙනෙකු අතින් නිර්මිත අධ්‍යාපනික ග්‍රන්ථ හා ඒවායේ අන්තර්ගතය ඉතා ම සැකෙවින් (ගීත ශික්ෂක, ගානවිද්‍යා - ඇම්.ජී.පෙරේරා<br>සංගීත - ප්‍රේමවංශ හපුවලාන<br>පෙරදිග සංගීත ශාස්ත්‍රය- බී.ඇස්.විජයරත්න.<br>භාවික ගීත- වින්සන්ට් සෝමපාල<br>ඛ්‍යාල ගීත -ආනන්ද ජයසිංහ<br>සංගීත සංහිතා-විමල් අභයසුන්දර<br>සිංහල ගැමි නාටකය- එදිරිවීර සරච්චන්ද්‍ර<br>හෙළ ගී මග- ඩබ්.බී.මකුලොලුව<br>ලංකාවේ සංගීත සම්භවය- සී. ද ඇස් කුලතිලක)<br>ආචාර්ය ලයනල් එදිරිසිංහ | මහනුවර යුගයේ දී ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශයට ඇති වූ බලපෑම් විග්‍රහ කරයි.<br><br>සංගීතය පිළිබඳ ව හෙළ බසින් ලියැවී ඇති ග්‍රන්ථ කියවීමට පෙලඹෙයි. | 10<br><br>08 |
| 7.0 ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි. | 7.1ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/ වාදනයේ යෙදෙයි.<br><br>7.2 ව්‍යාවහාරික සංගීතය සඳහා සංගීත භාණ්ඩ යොදා ගැනීමේ ක්‍රමවේද හඳුනා ගනියි. | • සොකරි, කෝලම්, නාඩගම්, නූර්ති, රංග ශෛලි<br>• එම රංග සම්ප්‍රදායයන්හි ගීත ගායනය/වාදනය<br>• නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද, භාණ්ඩ) තෝඩායම, ඉන්නිසය, පොතේසින්දුව, උරුට්ටුව යන අංශ ඇතුළත් ගීත ප්‍රායෝගික ව<br>• නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම, දොහොරාව, වාදිත (ගත්) ගීත වශයෙන් යොදා ගැනීම සනාථ කිරීමට ගීත ප්‍රායෝගික ව<br>• වයලීනය සුසර කිරීමේ විවිධ ක්‍රම හා කපිරිඤ්ඤා ගීතයක් වාදනය. | ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.<br>නාඩගම් රංග සම්ප්‍රදායයේ සුවිශේෂතා ප්‍රායෝගික ව පැහැදිලි කරයි.<br>නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම පැහැදිලි කරයි.<br>ව්‍යාවහාරික සංගීතයේ දී වයලීනය භාවිත වන ක්‍රම සොයා බලයි. | 04<br>08<br>04<br>04<br>02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි. | 8.1 රිද්මය, තාලය, ලය සහ ස්වර නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයයේ යෙදෙයි. | • ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය සහ Scale නිර්මාණයක දී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම් | විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කරගනිමින් නිර්මාණයේ යෙදෙයි. | 04 |
| | 8.2 විවිධ හඬතල නිර්මාණ කාර්යයයේ දී වැදගත් වන අයුරු සාකච්ඡා කරයි. | • හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු (Violin Family, Brass Family) | විවිධ හඬතල අනුව නිර්මාණය වී ඇති සංගීත භාණ්ඩ පවුල් පිළිබඳ විස්තර කරයි. | 04 |
| 9.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 9.1 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි. | • කෝමල නිෂාදය සහ කෝමල ගාන්ධාරය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය B.flal, E.flal Major Scale<br>• මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය F. G Major/Minor Scale | විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කර ගනිමින් නිර්මාණයේ යෙදෙයි. | 04<br>04 |
| 10.0 සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 10.1 නව තාක්ෂණික උපකරණ සංගීත නිර්මාණයේ දී සහ අධ්‍යයනයේ දී උපයෝගි වන අයුරු පරීක්ෂා කරමින් භාවිත කරයි. | • සංගීත නිර්මාණය, ශ්‍රවණය ගවේෂණය සඳහා පරිගණකයේ උපයෝගීතාව හා අදාළ මෙවලම් (පරිගණකය හැඳින්වීම, සාමාන්‍ය පරිගණකයක උපාංග හා පරිබාහිරින් එකතු කර ගනු ලබන උපාංග හා දෘඪාංග (Sound card, Midi Keyboard, Midi cable, Music soft ware)<br>• සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංස්කරණය සහ නිර්මාණය කර ගත් සංගීතය බෙදා හැරීම<br>• සංගීත අධ්‍යාපනය සඳහා අන්තර් ජාල භාවිතය සහ විවිධ වෙබ් අඩවි ආශ්‍රයෙන් සංගීත අධ්‍යාපනය ලබා ගැනීම සහ ගවේෂණය (ඇගයීම් සඳහා කාලච්ඡේද 36ක් වෙන් කළ හැකිය.) | පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණය පිළිබඳ වත් , අන්තර්ජාලය මඟින් සංගීත ඉගෙනීම පිළිබඳ වත් තර්කානුකූල අදහස් දක්වයි. | 06<br>10<br>10<br>-----<br>263<br>36 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 උත්තර භාරතීය සංගීතයට අයත් විවිධ ස්වර සංගති සහ හැඩයන්ගෙන් යුත් රාග කිහිපයක ස්වභාවය හඳුනා ගනිමින් ශිල්පීය ගුණාංග සහිත ව ගායනයේ/වාදනයේ යෙදෙයි. | • ජය ජයවන්ති, භෛරව සහ හංසධ්වනි යන රාගවල සර්ගම්<br>• නිර්දේශිත රාගයන්හි ස්වර අභ්‍යාස ගමක්, මීන්ඩ් සහිත ව<br>• නිර්දේශිත රාගවලට අයත් මධ්‍යලය ගීත වාදිත සහ ඒවායේ විශේෂ ස්වර සංගති, පූර්වාලාප සහ මධ්‍යාලාප, ඣාලා සමඟ රාග විස්තාරණය<br>• විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>• කුසලතා සහිත ව සමස්ත ගායනය/වාදනය | • ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් රාගධාරී ගීත ගායනයේ වාදනයේ යෙදෙයි.<br>• නිර්දේශිත රාගවල සෛද්ධාන්තික පසුබිම හා සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කරමින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගනියි. | 06<br>03<br>27<br>12<br>09 |
| | 1.2 සමප්‍රකෘති රාග යුගලයක සමප්‍රකෘති බව ප්‍රායෝගික ව පැහැදිලි කරයි. | • භෛරව-කාලිංගඩා යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මඟින් ප්‍රායෝගිකව | • සමප්‍රකෘති රාග දෙකක සමවිෂමතා ප්‍රායෝගික ව දක්වයි. | 08 |
| | 1.3 විලම්බලය ඛ්‍යාල් ගීතයක් / වාදිතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයා/වයා ප්‍රදර්ශනය කරයි. | • බාගේශ්‍රී, දේස්, ආසාවරී, ජයජයවන්ති, භෛරව යන රාග අතරින් එකකට අයත් විලම්බ ඛ්‍යාල් ගීතයක් වාදිතයක් පූර්වාලාප, මධ්‍යාලාප, බෝල්ආලාප, කෙඩාර්ඩ් ආලාප, සහ තානාලංකාර සමග.(වාදනය කරන සිසුන් පිළිබඳව අවධානය යොමුකරන්න.) | • විලම්බලය ඛ්‍යාල් ගීතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයා/වයා ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 14 |
| | 1.4 විලම්බලය හා සුවිශේෂ ව බැඳුණු තාල පද එකිනෙක සසඳමින් ඒවා ප්‍රායෝගික ව අභ්‍යාස කරයි. | • ඒක්තාල්, තීලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ නිරූපණය<br>• ඉහත තාල හා සමාන වෙනත් තාල හා ප්‍රායෝගික ව සන්සන්දනය (චෞතාල්, පංජාබි, ත්‍රිතාල්)<br>• තාල අධ්‍යයනය සමගුණ නිරූපණය. (හින්ච් තාලය, බෙම්ටෝ තාලය, පංජාබි තාලය සහ ධමාර් තාලය) | • උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ඇතුළත් තාල පද ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතාව ලබයි. | 04<br>06<br>04<br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. | 2.1 අපරදිග සංගීතය තුළ සංගීත නිර්මාණයන්හි ස්වභාවය ගවේෂණය කරමින් ඒවාට දායක වූ සංගීතඥයන් කිහිප දෙනෙකුගේ තොරතුරු විමර්ශනය කරයි. | • ත්‍රිතාල්, ඒක්තාල්, තාල තබ්ලාවෙන් වාදනය.<br>• Symphony ස්වභාවය සහ මොසාර්ට්, බිතෝවන්, බාක් සංගීතඥයන්ගේ තොරතුරු<br>• Ballet, Opera ( බැලේ, ඔපෙරා)වල සංගීතයේ ස්වභාවය<br>• සංගීතය වින්දනාත්මක සවන් දීමේ අභ්‍යාස | • බටහිර සංගීතය තුළ පිළිගත් උත්තරීතර සංගීතඥයන් පිළිබඳ දැනුම ලබමින් බටහිර සංගීත කෘති සංසන්දනාත්මක ව අගයයි. | 04<br>04<br>04 |
| 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 3.1 බටහිර සංගීත භාණ්ඩවල ස්වභාවය හඳුනා ගනිමින් වර්ග කරයි.<br>3.2 වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | • Strings, Wind, Percussion වර්ගීකරණය, සහ පාසල් පද්ධතියේ භාවිත වන සංගීත භාණ්ඩ හඳුනාගැනීම.<br>• ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය | • බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයේ යෙදෙමින් භාණ්ඩ හඳුනා ගනියි.<br>• භාණ්ඩ වාදනයේ යෙදෙයි | 02<br>06 |
| 4.0 සංගීත රසාස්වාද යේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 4.1 සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනා ගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදයේ හුරු වෙයි. | • ගසල් ගායන ශෛලිය (පන්කජ් උදාස්, ජග්ජිත්සිං) ගුලාම් අලි<br>• ඛ්‍යාල් ගායන ශෛලිය (උස්තාද් අමීර් ඛාන්, පර්වීන් සුල්තානා, පණ්ඩිත් ජස්රාජ් ,උස්තාද් රෂීඩ් ඛාන්, පණ්ඩිත් බිම්සන් ජෝෂී)<br>• තබ්ලා ඒකල වාදන (උස්තාද්, අල්ලාරක්ඛා, උස්තාද් ශබීර් හුසේන්) (පණ්ඩිත් අනින්දෝ චැටර්ජි, උස්තාද් අෆාක් හුසේන් ඛාන්)<br>• සිතාර්, එස්රාජ්, දිල්රුබා සන්තූර්, බටනලා, වයලීන්, ෂෙහනායි, සරෝද්, සාරංගි, වාදන රසාස්වාදය | • උත්තර භාරතීය සංගීතයේ අතිප්‍රවීණ සංගීතඥයන් ගේ නිර්මාණ රසවිඳිමින් ඔවුන්ගේ ගායන වාදන අධ්‍යයනයට පෙලඹෙයි. | 08<br>08<br>04<br>04 |
| 5.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ව ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 5.1 සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි. | • මුදුප්පදය සහිත ප්‍රශස්ති<br>• තාලරූප දෙකක් සහිත හටන් කාව්‍ය<br>• සැවුලා වන්නම හා එහි තාල රූපයේ විශේෂත්වය.<br>• ගණපති සවිදම, අස්නෙ,<br>• වැලපුම් ගී | • දේශීය ජනසංගීතාංග අගය කරමින් ප්‍රාසංගික ව යොදා ගැනීමේ හැකියාව ලබා ගැනීමට ගායනයේ/වාදනයේ යෙදෙයි. | 02<br>02<br>02<br>02<br>02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | 6.1 භාරතීය සංගීතයේ ප්‍රභවය සහ විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | • වේද ගායනා සංගීතයට මුල් වූ අයුරු<br>• ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම<br>• පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම<br>• සංගීතඥයන්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම (සාරංගදේව, අමීර්ඛුස්රු, පණ්ඩිත් භාත්ඛණ්ඩේ, මහාචාර්ය වී.එස්. නිගාම් පඬිවරුන්ගෙන් සංගීතයට සිදු වූ සේවය) | • භාරතීය සංගීතයේ වර්ධනයට හා විකාශයට බලපෑ හේතු විමර්ශනයට කරයි.<br>• නිර්දේශිත ඉන්දීය සංගීතඥයන් සිවුදෙනෙකු අගයයි. | 04<br>04<br>04<br>04 |
| 7.0 ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 7.1 ව්‍යාවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි. | • එක් එක් යුගවල දී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් (මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය රේඛාව චිත්‍රපටයේ සංගීතය, සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය ආශ්‍රයෙන් විචාරය)<br>• නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳ ව සැකෙවින් සාකච්ඡා කිරීම.<br>• ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය හා භාණ්ඩ මඟින් වාදනය<br>රේඛාව - ඕළු නෙළුම්<br>මාතලන් - කොවුලන් හඬයි<br>සන්දේශය - කටේ කිරි සුවඳ<br>රන්මුතුදූව - ගලන ගඟකි<br>සත්සමුදුර - සිනිඳු සුදුමුතු<br>බඹරු ඇවිත් - උදුම්බරා<br>හිතක පිපුණු මල් - කමලාශනී<br>හුලවාලි - කුඩා ගමේ<br>එක්ටැම්ගේ - උන්මාද සිතුවම්<br>විසිදෑල - ගුමුගුමුව වදුලේ<br>• ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය ඔස්සේ මතු වන සිංහල සංගීතයෙහි බටහිර බලපෑම | • මෙරට චිත්‍රපට සංගීතයේ වර්ධනීය අවස්ථා විචාරයේ යෙදෙයි.<br>• චිත්‍රපට ගීත ගයමින් රසවිඳියි.<br>කණ්ඩායම් සංගීතයෙහි සාධනීය ලක්ෂණ සාකච්ඡා කරමින් ගීත නිර්මාණයේ යෙදෙයි. | 08<br>04<br>04<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 8.1 සරල ගීතයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂ කොටස් සහිත ව ගීත නිර්මාණය කරයි.<br><br>8.2 පාසලේ පවතින සංගීත භාණ්ඩ හා විවිධ ආදේශ භාණ්ඩ උපයෝගි කරගනිමින් වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණය කරයි. | • Interlude & Introduction<br>• Bits, Counter Points, Chords, Adlib යන සංකල්ප පිළිබඳ ගී තනු ඇසුරින් අවබෝධය<br>• ඉහත කොටස් ඇතුළත් ගීත නිර්මාණය<br><br>• සංගීත වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණය කරයි. | • සරල ගීතයක අන්තර්ගත කොටස් විමසමින් නව නිර්මාණ බිහි කරයි.<br><br>• වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණයේ අත්දැකීම් ලබයි. | 04<br>04<br>04<br><br>06 |
| 9.0 සංකේතානුසාරයේ සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 9.1විවිධ සංකේත ඇසුරු කරමින් සංගීත ප්‍රස්තාර කරයි. | • අපරදිග සංගීත ප්‍රස්තාරවල ප්‍රකාශන සංකේත (f.ff.p.pp.slur, staccato, legato, pizzicato)<br>• සංගීත ප්‍රස්තාරයක් ඇසුරින් ඉහත සංකේත භාවිත හුරුව<br>• නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි සහ සංකේත එම ප්‍රස්තාරයක් ඇසුරින් ප්‍රායෝගික ව භාවිත හුරුව | • බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී භාවිත වන ප්‍රකාශන සංකේත හඳුනා ගනියි.<br>• නූතන ව්‍යාවහාරික සංගීතයට අවශ්‍ය පරිදි සංගීත ප්‍රස්තාර කිරීමේ ක්‍රම ශිල්ප භාවිත කරයි. | 02<br>04<br>04 |
| 10.0 සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 10.1 සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක තත්ත්වයන් පරීක්ෂා කර ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි. | • ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ කෝඩ්ස් ගොඩනැගෙන අයුරු Chords & Harmony | • එක් ස්වරයක් හා සමඟ තවත් ස්වරයක් සුසංයෝග කිරීමේ විධි හඳුනා ගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි. | • අපට සංගීතය ඇසෙන අයුරු<br>• ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු<br>• කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු | • සංගීත අධ්‍යයනයේ දී කර්ණේන්ද්‍රිය හා ස්වරාලය වැදගත් වන අයුරු ජීව විද්‍යාත්මක හේතු දක්වමින් පැහැදිලි කරයි. | 03<br>03<br>02 |
| 11.0 සංගීතයේ මනෝ විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර තම ජීවිතය වඩාත් සාර්ථක කර ගනියි. | 11.1 සංගීතය හා බැඳි මනෝ විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කර එහි ඇති වාසිදායක තත්ත්වයන් ජීවිතයට එකතු කර ගනියි. | • බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාව (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්)<br>• මනෝ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ලෙස- මානසික ආතතිය පහ කරන ප්‍රතිකාර ක්‍රමයක් ලෙස සංගීතය (සංගීත චිකිත්සාව) | • සංගීතමය ඥානය හා බුද්ධිය අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කරයි.<br>• සංගීතය මානසික හා කායික සුවය සඳහා භාවිත කරයි. | 08<br><br>02 |
| | | ප්‍රයෝගික ඇගයීම් ( වාර 3 සඳහා ) | | 18<br>18<br>-----<br>287<br>----- |

# 7.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ශිෂ්‍යයාගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව, භාෂාව ආදි විෂයයන් අවශ්‍ය වන්නා සේ ම ඔවුන්ගේ වින්දන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම අත්‍යවශ්‍ය වේ. නිපුණතා පාදක ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයාගේ සංගීත විෂය හා බැඳි ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම මෙන් ම යහපත් ආකල්ප වර්ධනයෙන් සුසමාහිත පෞරුෂයක් ගොඩනැඟීම අපේක්ෂා කෙරේ.

මෙම කාර්යයෙහිලා විවිධ ප්‍රායෝගික අත්දැකීම් ලැබිය හැකි පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම්හි සිසුන්ට යෙදීමට අවශ්‍ය අවකාශ සැලසීම ඉතා වැදගත් වේ.

1. ළමා ගීත ගායන වාදන තරග
2. ළමා නාට්‍ය තරග
3. ගායන, වාදන ප්‍රදර්ශන
4. සෞන්දර්ය කලා සංගම් පිහිටුවීම
5. පන්ති මට්ටමේ කෙටි විවිධ ප්‍රසංග
6. වාර්ෂික විවිධ ප්‍රසංග
7. නව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මඟින් ආදේශ භාණ්ඩ නිර්මාණ
8. බැති ගී ප්‍රසංග
9. පරිගණක තාක්ෂණය ඇසුරෙන් නිර්මාණ
10. උදෑසන රැස්වීම ආශ්‍රිත ව කරනු ලබන ගායන වාදන ක්‍රියාකාරකම්
11. පාසල අවට ප්‍රදේශයේ පැවැත්වෙන විශේෂ සංගීත උත්සව හා ශාන්තිකර්ම
12. රාජ්‍ය උත්සව හා බැඳි ගායන වාදන අංග
13. පාසල් තූර්ය වාදන කණ්ඩායම්

මෙම ක්‍රියාකාරකම් නිර්දේශිත විෂය කරුණු හා බද්ධ කිරීම තුළින් පන්තිකාමරය තුළ ලද නොහැකි සුවිශේෂ ඉගෙනුම් අත්දැකීම් ලැබීමට සිසුන්ට ඉඩකඩ ලැබේ. එම නිසා සිසුන්ගේ සාමාන්‍ය අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාකාරිත්වය හා විශේෂයෙන් ම ඉගෙනුමට අවශ්‍ය මානසික සූදානම ප්‍රවර්ධනය කර ගැනීමට හැකි වේ.

# 8.0 තක්සේරුව හා ඇගයීම

පෙරදිග සංගීත විෂය තක්සේරුව හා ඇගයීම සිදුවන්නේ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සිදුවන අවස්ථාවේදීම ය. අදාළ ක්‍රියාකාරකමට සුදුසු නිර්ණායක භාවිත කරමින් සිසුන් ඇගයීමට ලක් කළ යුතු ය. සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උපස්තම්භන ලබාදීමත් සුදුසු ප්‍රතිපෝෂණ ලබාදීමත් මෙහි දී සිදුවේ.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමක දී ම තක්සේරුව හා ඇගයීම සිදුකිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථා, තක්සේරවටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදා ගත හැකි වේ.

සිසුන් ක්‍රියාකරකම්වල යෙදෙන අවස්ථාවල දී ඔවුන්ට සමීපව නිරීක්ෂණය කිරීමෙන් ඔවුන්ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයෙකුම අවම ප්‍රවීණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා කටයුතු කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුව නම් වේ. එසේම සිසුන් ස්වයං අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවලදී ඔවුන් ලඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කරමින් හා විශ්ලේෂණය කරමින් ඇගයීම ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසුන් කණ්ඩායම් සමස්ත පන්තිය හමුවේ සාමූහික ව ඉදිරිපත් කරන අදහස්, ඇගයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමටත් කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංගය වේ.

# 9.0 විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය**

| | |
|---|---|
| විශාරද සුදත් සමරසිංහ | අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව.<br>නි. අ. ජ. (ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය) |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| කපිල මැද්දෙගොඩ | මධ්‍යස්ථානාධිපති,<br>සම්පත් මධ්‍යස්ථානය, මීගොඩ |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | ගුරු සේවය, වැගොව්ව කනිෂ්ඨ විද්‍යාලය, මිනුවන්ගොඩ |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| අමරසිරි වික්‍රමරත්න මහතා | භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔළුවිල් |
| ශ්‍රීනාත් ගනේවත්ත මහතා | |

**12 ශ්‍රේණිය**

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 | • මන්ද්‍ර උච්ච සප්තක කරා විහිදුන ස්වර අභ්‍යාස | 02 | - | - |
| 02 | • කටහඬ පාලනය පිළිබඳ අභ්‍යාස | 02 | | - |
| 03 | • ගායනයේ දී සිරුරේ ඉරියව් (ස්වරාලය, උගුර, පිටකොන්ද මුහුණ) හෝ වාදනයේ ඉරියව් සහ හස්ත සාධන අභ්‍යාස.. | 02 | - | - |
| 04 | • භාගේශ්‍රී රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වරවිස්තාර, කෙටි ආලාපඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව ) | 18 | - | - |
| 21 | • දේස් රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වරවිස්තාර, කෙටි ආලාපඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව ) | - | 18 | - |
| 37 | • ආශාවරී රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වරවිස්තාර, කෙටි ආලාපඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව ) | - | - | 18 |
| 22 | • දේස් - තිලක්කාමෝද් යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව | - | 06 | - |
| 38 | • ආශාවරී-ජෞනපූරි යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව | - | - | 06 |
| 05 | • ගායනාසමය, මුඛ්‍යාංග | 02 | - | - |
| 06 | • ආලාප සහ ආලාප වර්ග | 02 | - | - |
| 23 | • තාන සහ විවිධ තාන වර්ග | - | 02 | - |
| 24 | • මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, සිද්ධාන්තික සහ ප්‍රායෝගික) | - | 08 | - |
| 07 | • තාල සංකල්පය (ගති මිති ලය සහ තාලපදයක කොටස්) | 02 | - | - |
| 08 | • ත්‍රිතාල්, ජප්තාල්, දීප්චන්දි, දාදරා හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ, දෙගුණ නිරූපණය | 04 | - | - |
| 09 | • ත්‍රිතාල්, ජප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු | 04 | - | - |
| 25 | • දේශීය තිත්තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප ප්‍රායෝගිකව භාවිතය | - | 04 | - |
| 10 | • විවිධ නිර්වචන මගින් සංගීතය යනු පැහැදිලි කිරීම. | 02 | - | - |
| 11 | • සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු (භාෂාව, දේශගුණික, භූගෝලීය සාධක) | 02 | - | - |
| 12 | • ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති (පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය Melody & Harmony සිද්ධාන්තය, ස්වර සාධනය) | 02 | - | - |
| 39 | • භාරතීය සංගීතයේ ස්වභාවය | - | - | 02 |

12 ශ්‍රේණිය

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 40 | • උත්තර සහ දක්ෂිණ පද්ධතිවල සමවිෂමතා | | - | 02 |
| 41 | • උතුරු ඉන්දීය ගායන ශෛලීන් (ධ්‍රැපද්, ධමාර්, චතුරංග හා බැදි සිද්ධාන්ත කොටස් ඇසුරින් තර්කානුකූලව සහ සංසන්දනාත්මක අදහස් | - | - | 04 |
| 42 | • ඛ්‍යාල්, ගායන ශෛලිය ( උසස් පෙළට නියමිත රාගයක විළම්භ ලය ගීතයේ ස්ථායි කොටසේ ප්‍රායෝගික පිවිසීම සමග ) | - | - | 06 |
| 43 | • භජන් ගායන ශෛලිය ( පයෝජි මෛනේ, තුමක චලිත, වෛශ්ණු වජනකෝ, ධීරසමීරේ යමුනා තීරේ, කලෙරාත මෝරා, යන ගීත අතරින් එකක ප්‍රායෝගික පිවිසීම සමග ) | - | - | 03 |
| 44 | • ගසල් ගීතයක් ප්‍රයෝගිකව | - | - | 03 |
| 26 | • තාරණා ගායන ශෛලිය සමග ගීතයක් ( මාලකෞන්ස් රාගයෙන් | - | 04 | - |
| 13<br>27<br>45 | • සියලු සිසුන් සඳහා ස්වරපුවරු භාණ්ඩ වාදනය (උසස් පෙළට ගැළපෙන ලෙස) | 04 | 04 | 04 |
| 14A<br>28<br>46<br>14B | • ගායනය ප්‍රධාන කරගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩ යකින් අධ්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා, පල්ටා, මුඛඩා ) වාදනය ප්‍රධාන කරගත් සිසුන් අධ්‍යතන සරල ගීතයක් ගායනය හෝ රාගධාරී ගීතයක් ගායනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා, පල්ටා, මුඛඩා ) | 04 | 04 | 04 |
| 29 | • වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යුහය, කොටස් පිළිබඳ දැනුම හා තබ්ලාවේ කොටස් | - | 02 | - |
| 47 | • වාදනය කරනු ලබන භාණ්ඩය තනිව සුසර කර ගැනීමේ අභ්‍යාස (ගායන කාලච්ඡේද වලදී නිර්දේශිත සියලු ප්‍රායෝගික කොටස් වාදනය කිරීම ) | -<br>- | -<br>- | 02<br>- |
| 15<br>30 | • ගුරුවරයාගේ අභිමතය පරිදි රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල/ හින්දි සරල ගීදෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් ඇසුරින් රසාස්වාදයේ යෙදීම සහ ගායනය/වාදනය | 03 | 03 | - |
| 16 | • ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු | 02 | - | - |
| 17 | • ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී | 02 | - | - |
| 31 | • උඩරට,පහතරට, සබරගමු වශයෙන් ගැමි ගී ගායනාවල වෙනස්කම් (ශාන්ති කර්ම ගී ඇසුරින්) | - | 04 | - |
| 48 | • අනාසාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද) | - | - | 06 |
| 49 | • මෙහෙ ගී (නෙලුම් ගී, (ඕසේ ගායනා) - වරම් ගී) | - | - | 03 |
| 32 | • මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය (රාජ්‍ය අනුග්‍රහය, රජවාසලේ සංගීතය හා සම්බන්ධ ආයතන, කවිකාරමඩුව, කර්ණාටක සංගීතයේ ආභාෂය) | - | 10 | - |

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 18 | • 50-60 දශකවල සංගීත අධ්‍යාපනය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයින් කිහිපදෙනෙකු අතින් නිර්මිත අධ්‍යාපනික ග්‍රන්ථ හා ඒවායේ අන්තර්ගතය ඉතාමත් සැකෙවින්<br>(ගානවිද්‍යා - ඇම්.ජී.පේරේරා<br>සංගීත - ප්‍රේමවංශ හපුවලාන<br>පෙරදිග සංගීත ශාස්ත්‍රය- බී.ඇස්.විජයරත්න.<br>භාවිත ගීත- වින්සන්ට් සෝමපාල<br>ඛ්‍යාල ගීත -ආනන්ද රණසිංහ<br>සංගීත සංහිතා-විමල් අභයසුන්දර<br>ගැමි නාටක- එදිරිවීර සරත්චන්ද්‍ර<br>හෙළගී මග- ඩබ්.බී.මකුලොලුව<br>සංගීත සම්භවය- සී. ද ඇස් කුලතිලක )<br>ආචාර්ය ලයනල් එදිරිසිංහ | 08 | -- | -- |
| 19 | • සොකරි, කෝලම්, රංග ශෛලීන් | 02 | - | - |
| 20 | • සොකරි, කෝලම්, ගීත ගායනය | 04 | - | - |
| 33 | • නූර්ති, නාඩගම්, රංග ශෛලීන් | - | 02 | |
| 34 | • නූර්ති, නාඩගම්, ගීත ගායනය/වාදනය | - | 04 | - |
| 35 | • නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද, භාණ්ඩ) තෝඩායම, ඉන්නිසය, පොතේසින්දුව, උරුට්ටුවයන අංශ ඇතුළත් ගීත ප්‍රායෝගිකව | - | 04 | - |
| 50 | • රාගධාරී පසුබිම, දොහොරාව, වාදිත (ගත්) ගීත වශයෙන් යොදා ගැනීම සනාථ කිරීමට ගීත ප්‍රායෝගිකව | - | - | 04 |
| 51 | • වයලීනය සුසර කිරීමේ විවිධ ක්‍රම හා කපිරිඤ්ඤාවක් වාදනය | - | - | 02 |
| 52 | • ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය සහ Scale නිර්මාණයකදී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම් | - | - | 04 |
| 53 | • හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු (Violin Family, Brass Family) | - | - | 04 |
| 54 | • කෝමළ නිෂාදය සහ කෝමළ ගාන්ධාරය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය B.flal, E.flal Major Scale | - | - | 04 |
| 55 | • මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය F. G Major/Minor Scal | - | - | 04 |
| 56 | • සංගීත නිර්මාණය, ශ්‍රවණය ගවේෂණය සඳහා පරිගණකයේ උපයෝගීතාවය හා අදාළ මෙවලම්<br>(පරිගණකය හැඳින්වීම, සාමාන්‍ය පරිගණකයක උපාංග හා පරිබාහිරින් එකතු කර ගනු ලබන උපාංග හා දෘඨාංග (Sound card, Midi Key board, Midi cable, Music soft ware) | - | - | 06 |
| 57 | • සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංස්කරණය සහ නිර්මාණය කර ගත් සංගීතය බෙදා හැරීම | - | - | 10 |
| 36 | • සංගීත අධ්‍යාපනය සඳහා අන්තර් ජාල භාවිතය සහ විවිධ වෙබ් අඩවි ආශ්‍රයෙන් සංගීත අධ්‍යාපනය ලබා ගැනීම සහ ගවේෂණය | - | 10 | - |
| | (ඇගයීම් - ප්‍රායෝගික වන ඇගයීම 01-02- | 06 | 06 | 06 |
| | ප්‍රායෝගික නොවන ඇගයීම 01-02-03- | 06 | 06 | 06 |
| | මුළු කාලච්ඡේද | 85 | 101 | 113 |

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 | • ජය ජයවන්ති, රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>ජය ජයවන්ති, රාගයේ සර්ගම්<br>ජය ජයවන්ති, රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>ජය ජයවන්ති, රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | 19 | - | - |
| 19 | • භෛරව රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>භෛරව රාගයේ සර්ගම්<br>භෛරව රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>භෛරව රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | - | 19 | - |
| 32 | • හංසධ්වනි රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>හංසධ්වනි රාගයේ සර්ගම්<br>හංසධ්වනි රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>හංසධ්වනි රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | - | - | 19 |
| 20 | • භෛරව-කාලිංගඩා යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මගින් ප්‍රායෝගිකව | - | 08 | - |
| 21 | • භාගේශ්‍රී , දේස් , ආශාවරී, ජය ජයවන්ති, භෛරව යන රාග අතරින් එකකට අයත් විලම්භලය ගීතයක් පූර්වාලාප, මධ්‍යාලාප,බෝල්ආලාප, සහ තානාලංකාර සමග. | - | 14 | - |
| 02 | • ඒක්තාල්, තිලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහසමගුණ නිරූපණය | 04 | - | - |
| 03 | • ඉහත තාලපද සමග සමගාමී වෙනත් තාලපද හා සන්සන්දනය | 06 | - | - |
| 33 | • ත්‍රිතාල් , ඒක්තාල්, තබ්ලාවෙන් නිරූපණය | | | 08 |
| 22 | • සරල තාල පද අධ්‍යයනය ( හින්ච්,බෙම්ටෝ,පංජාබි) | - | 04 | - |
| 04 | • Symphony ස්වභාවය සහ මොසාර්ට්, බිතෝවන්, බාක් සංගීතඥයින්ගේ තොරතුරු | 04 | - | - |
| 05 | • Ballet, Opera වල සංගීතයේ ස්වභාවය | 04 | - | - |
| 23 | • සංගීතය වින්දනාත්මක සවන් දීමේ අභ්‍යාස | - | 04 | - |
| 06 | • Strings, Wind, Percussion සිද්ධාන්තය, සහ පාසල් පද්ධතියේ භාවිත වන සංගීතභාණ්ඩ හඳුනාගැනීම. | 04 | - | - |
| 07, 24, 34 | • ස්වරපුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව වාදනය | 02 | 02 | 02 |
| 35 | • ගසල් ගායන ශෛලිය (උස්තාද් පන්කජ්උදාස්, ජග්ජිත්සිං) | - | - | 08 |
| 08 | • ඛ්‍යාල් ගායන ශෛලිය (උස්තාද් අමීර්ඛාන්, උස්තාද් බඩේගුළාම් අලිඛාන්, පර්වීන් සුල්තානා, පණ්ඩිත් ජස්රාජ් සිං ) | 02 | - | - |

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 36 | • තබ්ලා වාදනයක අංග (උස්තාද්, අල්ලාරක්ඛා, උස්තාද් සZකීර් හුසේන්. පණ්ඩිත් අනින්දෝ චැටර්ජි) | - | - | 08 |
| 37 | • සිතාර්, එස්රාජ්, සන්තූර්, බටනලා, වයලීන් ෂෙහනායි | - | - | 04 |
| | වාදන රසාස්වාදන | 02 | - | - |
| 09 | • මුද්‍රපදය සහිත ප්‍රශස්ති | 02 | - | - |
| 10 | • තාලරූප දෙකක් සහිත හටන් කාව්‍ය | 02 | - | - |
| 11 | • සැවුලා වන්නම හා එහි තාලරූපයේ විශේෂත්වය. | 02 | - | - |
| 12 | • ගණපති සව්දම, අස්නෙ, | 02 | - | - |
| 13 | • වැළපුම් ගී | | | |
| 25 | • වේද ගායනා සංගීතයට මුල් වූ අයුරු | - | 04 | - |
| 26 | • ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම | - | 04 | - |
| 27 | • පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම | - | 04 | - |
| 28 | • සංගීතඥයින්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම (සාරංගදේව, අමීර්ඛුෂ්රු, භාත්ඛණ්ඩේ, මහාචාර්ය නිගාම් පඬිවරුන්ගෙන් සංගීතයට සිදුවූ සේවය ) | - | 04 | - |
| 29 | • එක් එක් යුගවලදී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් (මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය රේඛාව චිත්‍රපටයේ සංගීතය, සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය ආශ්‍රයෙන් විචාරය) | - | 08 | - |
| 30 | • නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්‍ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳව සැකෙවින් සාකච්ඡා කිරීම. | - | 04 | - |
| 31 | • ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය හා භාණ්ඩ මගින් වාදනය ( රේඛාව-ඕලුනෙලුම් මාතලන්-කොවුලන් හඬයි සන්දේශය-කටේකිරි සුවඳ, රන්මුතුදූව-ගලනගඟකි, සත්සමුදුර-සිනිඳු සුදුමුතු, බඹරුඇවිත්-උදුම්බරා, හිතකපිපුණුමල්-කමලාශනී, හුලවාලි-කුඩා ගමේ. එක්ටැම්ගේ- උන්මාද සිතුවම්, වීසිදැල- ගුමුගුමුව වදුලේ) | - | 04 | - |
| 38 | • Interlude & Introduction | - | - | 04 |
| 39 | • Bits, Counter Points, Chords, Adlib යන සංකල්ප පිළිබඳ ගීතනු ඇසුරින් අවබෝධය | - | - | 04 |
| 40 | • ඉහත කොටස් ඇතුළත් ගීත නිර්මාණය | - | - | 04 |
| 41 | • ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය තුළින් මතුවන සිංහල සංගීතයෙහි බටහිර අඩයාළම | - | - | 04 |
| 42 | • සංගීත වාද්‍ය ඛණ්ඩයක් සාමූහිකව නිර්මාණය. | - | - | 06 |
| 43 | • අපරදිග සංගීත ප්‍රස්තාරවල ප්‍රකාශන සංකේත (f.ff.p.pp.slur, staccato, legato, pizzicato) | - | - | 02 |
| 44 | • සරල ප්‍රස්තාරයක් ඇසුරින් ඉහත සංකේත භාවිත හුරුව | - | - | 04 |
| 45 | • නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි සහ සංකේත එම ප්‍රස්තාරයක් ඇසුරින් ප්‍රායෝගිකව භාවිත හුරුව | - | - | 04 |
| 14 | • ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ කෝඩ්ස් ගොඩනැගෙන අයුරු Chords & Harmony | 06 | - | - |

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 15 | • අපට සංගීතය ඇසෙන අයුරු | 04 | - | - |
| 16 | • ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු | 03 | - | - |
| 17 | • කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු | 03 | - | - |
| 18 | • බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්) | 10 | - | - |
| | (ඇගයීම් - ප්‍රායෝගික වන ඇගයීම 01-02- | 06 | 06 | 06 |
| | ප්‍රායෝගික නොවන ඇගයීම 01-02-03- | 06 | 06 | 06 |
| | මුළුකාලච්ඡේද | 93 | 95 | 93 |

මුළුකාලච්ඡේද- 281 කි.